# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2065/35 - 2018 අප්‍රේල් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2018.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

ගොනු අංකය : DSK/LND/07/FI/22/ACQ/139.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය, පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර* : අ.ග.පි. 139 (අතිරේක අංකය 1)

පහත සඳහන් ඉඩම හම්බන්තොට දිස්ත්‍රික්කයේ උතුරු ගිරුවා පත්තුවේ කටුවන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මීගහහේන යන ගම පිහිටා ඇත.

01. කැබලි අංක 33

ඉඩමේ නම: කළුවෙගෙවත්ත සහ මාරගහවත්ත; ඉඩමේ විස්තරය: වත්ත, අවුරුදු 10 - 75 දක්වා වයසැති පොල් ගස් 11 යි, අවුරුදු 75 ක් පමණ වයසැති කොස් ගස් 03යි, අවුරුදු 10 ක් පමණ වයසැති දෙල් ගස් 63 යි, උළු සෙවිලි හා කපරාරු කරන ලද බිත්ති සහිත පාසල් ගොඩනැගිලි 1 ක්ද තිබේ; ප්‍රමාණය: අක්.02 රූඩ්. 00 පර්. 00.

ඉහත සඳහන් ඉඩමට අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියකියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2018 අගෝස්තු මස 29 වැනි දින පෙ.ව. 10.00 ට කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2018 අගෝස්තු මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයෙන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා අවශ්‍ය සියලු ඔප්පු සහ අනිකුත් ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුයි.

ඉරේෂා ලියනගම,
ප්‍රාදේශීය ලේකම්,
කටුවන.

2018 අප්‍රේල් මස 04 වැනි දින,
කටුවන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

04 - 707

1A - G 27417 - 22 (2018/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.